**<u>විසර්ජන ශීර්ෂය 152 වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය</u>**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

I - කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

II - කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව.

## <u>I කොටස</u>

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

---

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු.

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

2. **<u>ගිණුම්</u>**

2.1 **<u>විසර්ජන ගිණුම</u>**

(අ) **<u>මුළු ප්‍රතිපාදනය හා වියදම</u>**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.36,910,460,000 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 31,453,650,558 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු. 3,574,223,811 ක සිට රු.1,882,585,631 දක්වා වූ පරාශයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 22 ක් දක්වා පරාශයක පැවතිණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 2,032,665,000 | 26,346,970,000 | 1,958,752,121 | 22,846,659,068 | 73,912,879 | 3,500,310,932 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 1,377,375,000 | 7,153,450,000 | 1,339,780,614 | 5,308,458,755 | 37,594,386 | 1,844,991,245 |
| | **එකතුව** | **3,410,040,000** | **33,500,420,000** | **3,298,532,735** | **28,155,117,823** | **111,507,265** | **5,345,302,177** |

**(ආ) <u>වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය.</u>**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු. 1,358,685,798 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

**<u>වාරිමාර්ග දෙපාර්තමේන්තුව</u>.**

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ලැබුණු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය/ අතිරික්තය (2012 දෙසැම්බර් 31 දිනට) | ඉතිරිය පිළිබඳ නිරීක්ෂණය සංක්ෂිප්තව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 1,257,423,868 | 1,004,406,843 | 253,017,025 | ලැබුණු සම්පූර්ණ ප්‍රතිපාදන වලින් රු.323,562,855 ක් හෙවත් 24% ක් උපයෝජනය කර නොතිබුණි. |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 96,600,000 | 29,304,875 | 67,295,125 | |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 844,000 | - | 844,000 | |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 3,817,930 | 1,411,225 | 2,406,705 | |
| **එකතුව** | 1,358,685,798 | 1,035,122,943 | 323,562,855 | |

2.2 **අත්තිකාරම් ගිණුම්.**

2.2.1 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්.**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂයය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 152 | 15201 | 145,000,000 | 101,345,654 | 102,000,000 | 141,710,253 | 480,000,000 | 355,207,592 |
| 282 | 28201 | 9,000,000 | 7,149,432 | 4,800,000 | 8,150,085 | 42,000,000 | 29,175,683 |

2.3 **අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්**

(අ) **අග්‍රිම ගිණුම්.**

අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දින වන විට රු.6,701,105 ක් වූ අග්‍රිම බැර ශේෂයක් පැවතුනි.

(ආ) **පොදු තැන්පත් ගිණුම.**

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේනතුවේ පොද තැන්පත් ගිණුම් වල ශේෂ එකතුව රු. 379,683,071 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. | 6000/000/00/0015/0063/000 | 13,790,562 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 6000/0000/00/0001/0022/000 | 8,183,436 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0137/000 | 357,709,073 |
| එකතුව | | **379,683,071** |

## II කොටස

**එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාළ විස්තරාත්මක වාර්තාව**

**1. විසර්ජන ශීර්ෂය 152 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**

**1.1 විගණන විෂය පථය**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 පෙබරවාරි 18 දින අමාත්‍යාංශ ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.8 දක්වා ඡේද වල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛන හා පොත්පත් පවත්වා ගෙනයාම**

(i) අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට සහ ඉකුත් වර්ෂ වලදී නිකුත් කළ විගණන විමසුමකට 2013 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ii) දැදුරු ඔය, ඇඹිලිපිටිය, බදුල්ල, අම්පාර හා ඇලහැර යන ප්‍රදේශවල නල ළිං ඉදිකිරීම, නල ළිං පිරිසිදු කිරීම හා භූ ජල විද්‍යා පර්යේෂණ සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් දරන ලද වියදම් එම මණ්ඩලයට ප්‍රතිපූර්ණය කිරීමේදී දරන ලද වියදම්වලට අදාල වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.4,997,236 ක අදාල වූ ගනුදෙනු 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා අලාභහානි ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) **අය වැය විචලනය**

(i) වැය විෂයයන් 02 ක් යටතේ සළසා තිබුණු රු. 210,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.514,235,356 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 ත් සියයට 98 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) **අග්‍රිම ගිණුම්**

(i) මුදල් රෙගුලාසි 371 ප්‍රකාර කාර්ය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, 2012 දෙසැම්බර් 31 දින වන විටත් රු.19,930 ක් සඳහාවූ අතුරු අග්‍රිමයක් නිරවුල් කර නොතිබුණි.

(ii) 2012 නොවැම්බර් 20 දිනැති අංක 05/2012 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 2.4 ඡේදය ප්‍රකාර 2012 දෙසැම්බර් 31 දිනටවූ රු.6,701,105 ක අග්‍රිම ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නිරවුල් කර නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්ම වූ රු. 5,651,382 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 28201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 1,947,509 ක් විය. 2013 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂයෙන් රු.1,008,237 ක් පමණක් අයකර ගෙන තිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 විධිවිධාන ප්‍රකාර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයක් සිදු කර තිබුණද අභ්‍යන්තර විගණනයේදී අනාවරණය වූ කරුණු පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

### 1.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

භාණ්ඩාගාර ලේකම්ගේ 2000 ජූනි 12 දිනැති අංක අයි.ඒ.අයි/2000/1 දරන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටුව යටත් පිරිසෙයින් කාර්තුවකට එක් වරක් වත් රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ කමිටුව අවස්ථා දෙකකදී පමණක් රැස්වී තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

### (අ) නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව පැවති බව වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | කාල පරිච්ඡේදය | |
|---|---|---|---|
| | | වර්ෂ 1 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි |
| **මෝටර් වාහන** | | | |
| දඹුල්ල යාන්ත්‍රික වැඩපල | 37 | 26 | 11 |
| තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල | 11 | විස්තර නොමැත | |
| **යන්ත්‍ර සූත්‍ර** | | විස්තර නොමැත | |
| දඹුල්ල යාන්ත්‍රික වැඩපල | 01 | | |
| | | විස්තර නොමැත | |
| තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල | 01 | | |
| | | විස්තර නොමැත | |
| **වෙනත්** | | | |
| දඹුල්ල යාන්ත්‍රික වැඩපල | 01 | | |

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

2012 දෙසැම්බර් 17 දිනැති අංක පිඑෆ/ සමීක්ෂණ මණ්ඩල /01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් වාර්ෂික සමීක්ෂණ වාර්තාව 2013 අගෝස්තු 30 දින ඉදිරිපත්කර තිබුණි.

**(ඇ) <u>බාහිර පාර්ශවයන්ට දී ඇති වත්කම්</u>**

අමාත්‍යාංශය විසින් මෝටර් වාහන 05 ක් අවිධිමත් ලෙස 2010 වර්ෂයේ සිට වනජීවී හා ගොවිජන අමාත්‍යාංශය, තැපැල් අමාත්‍යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත මුදාහැර තිබූ බව නිරීක්ෂණය විය.

**(ඈ) <u>බේරුම් නොකළ බැරකම්</u>**

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 200,777,386 ක් වූ අතර, එම ශේෂය වසරකට වඩා අඩු කාල පරිච්ඡේදයකට අදාළ විය.

**1.6 කාර්ය සාධනය**

-----------------

**<u>ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්</u>**

අමාත්‍යාංශය සිය අරමුණු වලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියාකළ අවස්ථා නිරීක්ෂණය වූ අතර නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපනය සඳහා අමාත්‍යාංශයට සළසා තිබූ ප්‍රතිපාදනවලින් රු. 4,997,236 ක් දැදුරු ඔය, ඇඹිලිපිටිය, අම්පාර, බදුල්ල, ඇලහැර, යන ප්‍රදේශ වල නල ළිං අලුත්වැඩියාව, නලළිං ඉදිකිරීම හා භූ ජල විද්‍යාත්මක පරීක්ෂණ සඳහා වැයකර තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවන කාර්යයක් වන රාජ්‍ය අංශය සඳහා පෙරසවි ගොඩනැගිලි මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,063,660,596 ක් වැයකර තිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් පාලනය කරනු ලබන කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයට හා මහවැලි අධිකාරියට අයත් මඩාටුගම යාන්ත්‍රික වැඩපලට අවිධිමත් ලෙස බඳවාගෙන තිබුණු කාර්ය මණ්ඩලය සඳහා 2012 වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සළසා නොතිබුණු අතර වාරිමාර්ග යෝජනා ක්‍රමවල හදිසි පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ වැඩ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රු. 18,064,771 ක් මෙම ආයතනවල නඩත්තුව වෙනුවෙන් වැයකර තිබුණි. විස්තර පහත පරිදි දැක්වේ.

| ආයතනය | විස්තරය | මුදල |
|---|---|---|
| | | රු. |
| කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනය | සේවක වැටුප්, ගෘහ උපකරණ මිලදී ගැනීම් ඇතුළු නඩත්තු වියදම් | 11,786,759 |
| මඩාටුගම යාන්ත්‍රික වැඩපල | 2011 වර්ෂයේ වැටුප් | 3,315,509 |
| | 2012 නොවැම්බර් වැටුප් | 2,962,503 |
| | | **18,064,771** |

(ඇ) මහවැලි අධිකාරියට අයත් නිරාවිය ගොවිපලෙහි කුකුළන් ඇති කිරීමට මඩු ඉදිකිරීම සඳහා අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේදී රු. 8,513,972 ක මුදලක් නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බලගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ වැයකර තිබුණු අතර එය ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනි කාර්යයකි.

1.7 <u>මත භේදයට තුඩුදෙන ගනුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය යටතේ පවතින ජල සම්පත් මණ්ඩලය, මහවැලි අධිකාරිය හා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය යන ආයතන 3 හි නිලධාරීන් සඳහා ආයතනයට ආකර්ෂණය කර ගැනීමට මෙන්ම ආයතනය තුළ රඳවා ගැනීමට අපහසු සේවාවලට අයත් නිලධාරීන් දිරිගැන්වීම සඳහා දීමනා වශයෙන් මාසිකව රු. 15,000 ක දීමනාවක් ගෙවීම සුදුසු බවට අමාත්‍යාංශ ලේකම් විසින් 2012 ජනවාරි 25 දිනැති අංක IWRM/S/01 දරන ලිපියෙන් කර තිබුණු නිර්දේශය මත ජල සම්පත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී එහි තෝරාගත් නිලධාරීන් පිරිසක් සඳහා රු. 1,115,000 ක දිරි දීමනා ගෙවා තිබුණි. මෙවැනි ගෙවීමක් සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය අවශ්‍ය බව 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.7 වගන්තියේ සඳහන්ව තිබුණද අමත්‍යාංශ ලේකම්වරයා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමේ ව්‍යාපෘතිය යටතේ ජලාශවල හා වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ කාර්යයේ යෙදවීමට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7(අ), සහ (ආ), 2.8.2 මර්ගෝපදේශවලට පටහැනිව 2012 වර්ෂයේදී රු.967,996,000 ක් ගෙවා සැපයුම් කරුවන් තිදෙනෙකුගෙන් එක්ස්කැවේටර් 48 ක්, බැකෝ ලෝඩර් 12 ක්, මෝටර් ග්‍රේඩර් 02 ක් හා වයිබ්‍රේටින් රෝල් 14 ක් මිලදී ගෙන තිබුණ. එසේම එම මිලදී ගැනීම් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2012 ජූලි 07 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක NPD/LS/2012/01 දරන චක්‍රලේඛයේ 5.3 ජේදය ප්‍රකාරව පිහිටුවන ලද සැළසුම් ක්‍රියාත්මක කිරීමේ බලකාය මගින් තීරණය කර නොතිබුණි. තවද එම චක්‍රලේඛය ප්‍රකාරව මෙම මිලදී ගැනීම සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය යන ආයතන සතුව පවතින යන්ත්‍රෝපකරණ පිළිබඳව සළකා බලා ඊට අතිරේකව අවශ්‍ය යන්ත්‍ර පමණක් මිලදී ගැනීමට හෝ කුලී පදනම මත ලබා ගැනීමට ක්‍රියාකළ යුතු බව සඳහන් වුවද, එවැනි ඇගයීමක් සිදුකර නොතිබුණි. වැව්වල රොන්මඩ ඉවත් කිරීමෙන් පසු මෙම යන්ත්‍ර සූත්‍ර කෙසේ උපයෝජනය කරන්නේද යන්න පිළිබඳව අමාත්‍යාංශය සතුව සැලසුමක්ද නොතිබුණු අතර මෝටර් ග්‍රේඩර් 02 හා වයිබ්‍රේටින් රෝල් 14 ජලාශ හා වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ කාර්යය සඳහා යොදා නොගැනෙන බැවින් එම යන්ත මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් පැන නැගී නොතිබුණි.

මෙම යන්ත්‍රෝපකරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මඩාටුගම හා තඹුත්තේගම පිහිටි යාන්ත්‍රික වැඩපළ දෙකට භාරදී තිබුණු බව සඳහන් කර තිබුණද, ඒවා භාරගෙන තිබුණු නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා සිටි අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයට අයත් නොවන නිලධාරීන් බැවින් එම බාරගැනීම මතභේදයට තුඩුදී තිබුණි. එක් එක් යන්ත්‍රයේ සමාලෝචිත වර්ෂයේ මාසික පිරිවැය වාර්තා යන්ත්‍රවල ක්‍රියාකරුවන් පිළිබඳ විස්තර 2014 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යා

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 15 | 08 | - |
| (ii) | කොන්ත්‍රාත් | - | 01 | | 01 |
| (iii) | තෘතික මට්ටම | 02 | 02 | - | - |
| (iv) | ද්විතික මට්ටම | 39 | 30 | 09 | - |
| (v) | ප්‍රාථමික මට්ටම | 44 | 40 | 04 | - |
| (vi) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්පදනම) | 01 | 04 | | 03 |
| | එකතුව | 109 | 92 | 21 | 04 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩු 21 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.
- අනුමත සේවක සංඛ්‍යාව 291 ක් වුවත් එය 109 ක් ලෙස විගණනයට තහවුරු කර තිබුණි.
- 2012 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශයේ විවිධ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 806 ක් බඳවාගෙන තිබූ බව අමාත්‍යාංශයේ ගෙවීම් ලේඛණ අනුව තහවුරු වූ අතර එය අනුමත සේවක සංඛ්‍යාව හා සසඳන විට සියයට 867 ක් ගෙන තිබුණි. මෙම පත්වීම් සඳහා මුදල් රෙගුලාසි 71 ප්‍රකාර භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස පහත සඳහන් ආයතන වලින් ලබාගත් මානව සම්පත් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| **සේවක වර්ගය** | **සේවක සංඛ්‍යාව** | **වෙනත් පාර්ශවය** | **කාලපරිච්ඡේදය** |
|---|---|---|---|
| වාරිමාර්ග ඉංජිනේරු | 05 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සඳහන් නොවේ |
| ඉංජිනේරු සහකාර | 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2011 අප්‍රේල් සිට |
| සැලසුම් ශිල්පි | 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2008 ජනවාරි සිට |
| රියදුරු | 08 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2010-2011 |
| රියදුරු | 01 | මාර්ග සංවර්ධන අධිකාරිය | 2010-2011 |
| රියදුරු | 01 | මාර්ග සංවර්ධන අධිකාරිය | 2011 |
| කම්කරු | 03 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2010-2011 |

## 2. විසර්ජන ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 23 දින වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් පකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛන හා පොත්පත් පවත්වා ගෙනයාම**

(i) වාර්තා කර ඇති පරිදි දෙපාර්තමේන්තුව මුදල් රෙගුලාසි 272(2) අනුව කටයුතු නිම නොකළ 2011 හා 2012 වර්ෂයන්ට අදාල එකතුව රු.735,082 ක් වටිනා ගෙවීම් වවුචර් 04 ක් අස්ථානගත වී තිබුණි.

(ii) කොළඹ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ 2011 වර්ෂයට නිකුත් කර තිබූ රු. 175,000 ක ගෙවීම් කළ කම්කරු නාම ලේඛන 02 ක් ද, ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් 2012 වර්ෂය තුළදී නිකුත් කර තිබූ ස්ථිර කම්කරු නාම ලේඛන 50 ක් ද, විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා කම්කරු වැටුප් ගෙවීම් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(iii) දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2013 අප්‍රේල් 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර එම විමසුමට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 6,735,771,646 ක් විය.

(ආ) **අය වැය විචලනය**

(i) වැය විෂයයන් 03 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු. 450,000,000 ක් වූ සම්පූර්ණ මුලධන ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 24 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ත් සියයට 96 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) අමාත්‍යාංශ 3 කින් හා දෙපාර්තමේන්තුවකින් ලැබී තිබූ රු. 1,358,685,798 ක ප්‍රතිපාදනයෙන් රු. 1,035,122,943 ක් වැයකර තිබූ අතර රු. 323,562,855 ක ප්‍රතිපාදන උපයෝජන කර නොතිබුණි. එය ලද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 24 ක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) **පොදු තැන්පත් ගිණුම**

(i) වර්ෂ 2 ක් ඉක්ම වු රු. 53,464,992 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 571 (1) ප්‍රකාර සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් වු සියලු තැන්පතු පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**විෂය අංක 28201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 18,620,869 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) **ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 4 දෙනෙකුගෙන් රු. 453,964 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. 2010 සහ 2011 වර්ෂයන්හි පළාත් සභා කාර්යාලවලට මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකගේ ණය මුදල් වාරික වශයෙන් අයවන අතර රු. 203,480 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.**

(ii) **වැටුප් රහිත නිවාඩු මත විදේශ ගත වූ නිලධාරීන් 3 දෙනෙකුගෙන් රු. 151,615 ක මුදලක් අයවිය යුතුව පැවති අතර මින් නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.146,240 ක මුදලක් වර්ෂ 17 ක කාලයක සිට සහ අනෙකුත් නිලධාරීගෙන් අයවිය යුතු රු. 5,375 ක මුදලක් වර්ෂ 11 ක් තිස්සේ හිඟව පැවතුණි. පරිපාලනමය දුර්වලතා මත මෙම ණයකරුවන්ගේ ණය අයකර ගැනීමට නොහැකි වී තිබුණු අතර පසුගිය වසරේ විගණන වාර්තාවෙන්ද මේ සම්බන්ධයෙන් පෙන්වා දී ඇතත් එකී ණය ශේෂ පියවා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.**

(iii) **මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් / සේවකයන් 195 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 15,128,707 ක ණය ශේෂයක් 2012 දෙසැම්බර් 31 දිනට අයවීම් නතරව තිබුණි. ණය ශේෂ පියවා ගැනීමට අදාල විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය ප්‍රමාණවත් නොවීම, විශ්‍රාම ලිපි ගොනුවල අඩුපාඩු නිසා විශ්‍රාම වැටුප් සකස් කිරීමට නොහැකි වීම, රජයේ නිවාස භාර නොදීම, විනය පරීක්ෂණ අවසන් නොවීම වැනි හේතු මත මෙම ශේෂ පියවා ගැනීම ප්‍රමාද වී තිබුණි.**

(iv) **වැඩතහනමට ලක් වු නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු.653,893 ක ණය මුදලක් අයවිය යුතුව තිබුණු අතර එම ණය ශේෂ අතර වසර 20 ක් තරම් පැරණි ණය ශේෂද පැවැතුණි. වැඩ තහනමට ලක්වීමට හේතු හඳුනාගෙන එම නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකරගැනීමට ආයතනය විසින් ක්‍රියානොකිරීම මත මෙම ණය ශේෂ දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී පැවැතුණි.**

(v) **සේවය හැර ගිය නිලධාරීන් 37 දෙනෙකුගෙන් රු.1,838,694 ක ණය ශේෂ අයවිය යුතුව ඇත.ඒ අතර වර්ෂ 17 තරම් දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂද පවතින බව නිරීක්ෂණය විය.මෙම ණයකරුවන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කාලීනව ක්‍රියාමාර්ග නොගැනීම මෙම ණය ශේෂ දීර්ඝ කාලයක් තිස්සේ හිඟව පැවතීමට හේතුවී තිබුණි.**

## 2.4 යහ පාලනය හා ගිණුම්කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.**

### 2.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

**2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 මාර්තු 08 දින පිළියෙල කර තිබුණි.**

### 2.4.3 අභ්‍යන්තර විගණනය

**2012 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන විමසුම් 20 ක් නිකුත් කර තිබූ නමුත් ඒවායේ සඳහන් අඩුපාඩු නිවැරදි කර ගැනීමේ කාර්යක්ෂම ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව තුළ නොතිබුණි.**

### 2.4.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

**භාණ්ඩාගාර ලේකම්ගේ 2000 ජූනි 12 දිනැති අංක අයි.ඒ.අයි/2000/1 දරන ලිපියේ 01 ඡේදය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටුව යටත් පිරිසෙන් කාර්තුවකට එක් වරක්වත් රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ කමිටු රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි.**

## 2.5 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

#### (i) යන්ත්‍ර සූත්‍ර

යලි පුබුදමු ව්‍යාපෘතිය මගින් කල්මුණේ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ කරවාහු ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබූ රු. 12,000,000 ක් වටිනා SR 70 වර්ගයේ එක්ස්කැවේටරයක් සහ බාජ් එකක් 2010 වර්ෂයේදී තාවකාලිකව ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය වෙත රැගෙනවිත් තිබූ අතර හදිසි අනතුරකට භාජනය වීම නිසා එය 2011 මාර්තු 23 දින සිට නිෂ්ක්‍රියව පැවති බව නිරීක්ෂණය විය.

#### (ii) නිවාස

2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව දෙපාර්තමේන්තුව සතු රජයේ නිවාස 310 ක පදිංචියට නිලධාරීන් ඉදිරිපත් නොවීම, ඒවා අබලන්ව පැවැතීම යන හේතූන් මත දීර්ඝ කාලයක සිට භාවිතයෙන් තොරව පැවතුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/එෆ්එස්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග කාර්යාල 10 ක භාණ්ඩ සමීක්ෂණය පවත්වා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2012 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌණතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(iii) ඉහත (i) ජේදයේ සඳහන් කාර්යාල 10 න් අනුරාධපුර, මහනුවර කලාප වාරිමාර්ග කාර්යාල දෙකෙහි සහ අම්පාර, රත්මලාන යන යාන්ත්‍රික ඉංජිනේරු වැඩපල දෙකෙහි 2011 වර්ෂයේදී ද භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි.

**(ඈ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

(i) 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් පරිදි දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 21 ක සිටින අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් නිත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) නිල නිවාස 54 ක් රජයේ වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වෙත පවරාදී තිබූ බව 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන්ව තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, මහවැලි අධිකාරිය හා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව තිබුණු වාහන 11 ක් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු බව 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා අභ්‍යන්තර විගණන විමසුම් අනුව අනාවරණය වී තිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

(i) දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.1,220,829,266 ක් වූ අතර, එම ශේෂය වසරකට වඩා අඩු කාල පරිච්ඡේදයකට අදාල විය.

(ii) මුදල් රෙගුලාසි 94 විධිවිධාන ප්‍රකාර දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන නොඉක්ම විය යුතු වුවත්, වැය විෂයයන් 8 ක ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු. 307,968,770 ක බැරකම්වලට බැඳී තිබුණි.

## 2.6 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) මුදල් රෙගුලාසි 104 | 2,398,474 | ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ SR70 දරන කොබෙල්කෝ වර්ගයේ එක්ස්කැවේටරයක් 2011 මාර්තු 23 දින අනතුරකට භාජනය වී තිබුණද ඒ සම්බන්ධයෙන් මාස 3 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව 2012 දෙසැම්බර් 31 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 135 | 131,456 | ගාල්ල වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට හා මාතර වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අයත් රු.131,456 ක ගෙවීම් අනුමත කිරීම, සහතික කිරීම සහ ගෙවීම යන සියලු කටයුතු එක් නිලධාරියකු අතින් පමණක් සිදුව තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 139(4) හා මුදල් රෙගුලාසි 264(1) | 1,680,562,489 | ගාල්ල කලාප අධ්‍යක්ෂ කාර්යාලයේ, ගිං ගඟ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ හා ප්‍රධාන කාර්යාලයේ ගිණුම්වලින් සිදු කළ ගෙවීම් සඳහා කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 156(5) | - | ප්‍රධාන කාර්යාලයේ සහ කොළඹ කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ ණය ලේඛනයේ සහ විසර්ජන වැය ලෙජරයේ මකන තීන්ත යොදාගෙන වෙනස් කිරීම, අපැහැදිලි ලෙස ලියා තැබීම, එකමත එක ලියා තැබීම, අධිකාරී බලයකින් තොරව වෙනස් කිරීම යනාදී වැරදි සිදුකර තිබුණි. |

| | | |
|---|---|---|
| (v) මුදල් රෙගුලාසි 267(1) | 885,345 | ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ තම බැංකු ගිණුමට රු.885,345 ක් වූ වැටුප් ගෙන්වා ගත් නිලධාරීන් 45 ක් විසින් පඩි ලැයිස්තුවේ අත්සන් කර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 316 (2) | - | ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ සේප්පුවේ තැන්පත් කළ මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (vii) මුදල් රෙගුලාසි 447 (4) | 1,220,829,266 | සියලුම බැරකම් වැය ලෙජරයේ සටහන් කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | 987,511 | නිලධාරීන් 12 දෙනෙකුගේ එකතුව රු.987,511 ක අතිරේක ඉන්ධන දීමනා ප්‍රතිපූර්ණය කිරීම් සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | - | ඇතැම් කලාප හා වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලට ඇගිලි සළකුණු යන්ත්‍ර හඳුන්වා දී නොතිබුණි. |
| **(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| (i) 2012 ඔක්තෝබර් 08 දිනැති අංක BD/A/AO/BC දරන චක්‍රලේඛය | 985,546 | ඉන්ධන දීමනා හා ප්‍රවාහන දීමනා ලබාගන්නා නිලධාරීන් අදාල කාර්යයට ඒවා යොදවා ගන්නේද යන්න මාස 03 කට වරක් අභ්‍යන්තර විගණන පරීක්ෂාව මගින් තහවුරු කරගත යුතු වුවත්, එවැනි තහවුරු කරගැනීමක් සිදුකර නොතිබුණි. |
| (ii) 2012 නොවැම්බර් 20 දිනැති අංක 05/ 2012 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | 212,260 | 2012 දෙසැම්බර් 31 දිනට පෙර මුදල් පොත පියවා ඉතිරි මුදල් ශේෂය බැංකුගත කළ යුතු වුවත්, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 5 ක මුදල් පොත් පියවා ශේෂය බැංකුගත කර නොතිබුණි. |
| **(ඈ) ජාතික අයවැය චක්‍රලේඛ** | | |
| 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන චක්‍රලේඛයේ 2.5 ඡේදය | - | යෝජිත ඉතිරිකිරීම් ඇතුළත් වන පරිදි සංශෝධිත අයවැය ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ඉ) වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛය** | | |
| 2012 පෙබරවාරි 06 දිනැති අංක 01/2012 දරන වාරිමාර්ග දෙපාර්තමේන්තු මූල්‍ය බලතල පැවරීමේ චක්‍රලේඛය | 5,465,888,892 | ප්‍රධාන කාර්යාලයේ අක් මුදල් ගෙවීම් වවුචර් නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් විසින් අනුමත කළ යුතුව තිබුණත් එසේ කර නොතිබුණි. |

## 2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වු අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබු බව අභ්‍යන්තර විගණන වාර්තා අනුව අනාවරණය විය.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ගිවිසුම් දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| | | රු. | | |
| **<u>ත්‍රිකුණාමල කලාපය</u>** | | | | |
| (i) | SSC/MD/26/2012 මහවැලි ගංවතුර බැම්මේ හැරවුම් නිර්මිතය වැඩිදියුණු කිරීම | 65,000 | 2012.03.12 | කොන්ත්‍රාත්කරුවන් එම වැඩ කිරීමට ඉදිරිපත් නොවීම |
| (ii) | SSC/MD/35/2012 තංගතුරෙයි වම් ඉවුර ඇල ප්‍රධාන ඇලේ බෙදුම් ඇල 06 හි රෙගියුලේටරය අළුත්වැඩියා කිරීම | 55,000 | 2012.04.24 | වැඩ භාරගත් ගොවි සංවිධානය විසින් වැඩ ආරම්භ නොකිරීම |
| (iii) | RAP/PPMUCE/CBO/RD I(A)/02/ 2011 IBMC- D-6 ඇලෙහි මීටර් 2090 ස්ථානයේ පැති බැම්මක් ඉදිකිරීම | 484,000 | 2011.08.27 | අධික වර්ෂාව හා වරින් වර ඇලෙහි වැඩිවන ජලය නිසා එම වැඩ ගොවි සංවිධානය විසින් නවතා තිබුණි. |

(ආ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.**

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ වර්ෂය | නිම කළ යුතු වර්ෂය | 2012 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | | | රු. මිලියන | |
| යාන් ඔය | 8,700 | 2007 | 2012 | 9 | පාරිසරික ඇගයීම් වාර්තාව අනුමත නොවීම |
| පහළ ඌව ජලාශය | 550 | 2005 | 2012 | 182 | අයවැය ප්‍රතිපාදන කපා හැරීම,අක් මුදල් ප්‍රමාණවත් නොවීම හා අයහපත් කාලගුණ තත්ත්වයන් |
| මහාගෝනා වැව | 169 | 2008 | 2017 | 0.5 | පාරිසරික ඇගයීම් වාර්තාවට අනුමැතිය ප්‍රමාද වීම |
| ගල්ඔය නවෝදය | 1,260 | 2009 | 2012 | 416 | අක් මුදල් ප්‍රමාණවත් නොවීම |
| මොරාණ ජලාශය | 1,700 | 2012 | 2020 | 5 | පාරිසරික ඇගයීම් වාර්තාව ප්‍රමාදවීම හා ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වීම |
| ඇල්ලේ වැව | 467 | 2012 | 2013 | නැත | අයවැය ප්‍රතිපාදන කපා හැරීම |
| දීගිලි ඔය | 1,460 | 2012 | 2014 | නැත | අයවැය ප්‍රතිපාදන කපාහැරීම හා පාරිසරික ඇගයීම් වාර්තාව ප්‍රමාද වීම |
| කළුගල් ඔය | 1,481 | 2012 | 2015 | 2 | අයවැය ප්‍රතිපාදන කපාහැරීම හා පාරිසරික ඇගයීම් වාර්තාව ප්‍රමාද වීම |
| කුඹුක්කන් ඔය | 10,000 | 2012 | 2013 | නැත | අයවැය ප්‍රතිපාදන කපාහැරීම හා පාරිසරික ඇගයීම් වාර්තාව ප්‍රමාද වීම |
| ගුරුගල් ඔය | 400 | 2009 | 2012 | 218 | අක්මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම හා අධික වර්ෂාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| නාපෙළඩ වතුර | 40 | 2007 | 2012 | 5 | අයහපත් කාලගුණික තත්ත්වයන් මත පස් වැඩ කළ නොහැකි වීම |
| විලකණ්ඩිය | 81 | 2011 | 2012 | 15 | අයහපත් කාලගුණික තත්ත්වයන් මත පස් වැඩ කළ නොහැකි වීම |
| ගෝනගලතැන්න | 55 | 2012 | 2013 | 0.5 | පාරිසරික ඇගයීම් වාර්තාව සඳහා අනුමැතිය ප්‍රමාද වීම |
| සම්බුද්ධ ජයන්ති වැවේ වාන් ඇල අසල පෙට්ටි බෝක්කු ඉදිකිරීම | 1.2 | 2011 | 2012 | නැත | අධික වැසි සහිත කාලගුණය |
| මල්කම්පිඩ්ඩි අමුණ ව්‍යාපාරයේ යටිගං පැත්තේ ගංවතුර හානි අළුත්වැඩියාව | 1.9 | 2011 | 2012 | නැත | ඉදිරිපත් කර නැත |
| සෙංගපාඩෙයි ගඟේ වම් ඉවුර ආරම්භක බැම්මේ කි.මී.3+305 සිට කි.මී.3+350 සහ කි.මී.6+795 සිට කි.මී. 6+850 දක්වා ගැබියන් පෙට්ටි ඉදිකිරීම | 3.0 | 2011 | 2012 | නැත | සෙංගපාඩෙයි ගඟේ අපවහන ජලය ගලා යාම නතර නොවීම නිසා හා 2012 / 2013 මහ කන්නයට ජලය නිකුත් කිරීමේ කටයුතු නිසා |
| Construction of current meter station at structure 27+180 K.M. in RBMC on Illukuchenal unit | 0.9 | 2012 | 2012 | නැත | ගං වතුර ප්‍රධාන ඇලේ ගලා යාම නිසා |

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

2012 නොවැම්බර් 26 දිනැති අංක 227/2012 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාර බැංකු ගිණුම් 10 කට අදාල විස්තර 2012 වර්ෂයේ විසර්ජන ගිණුමේ බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

## 2.9 මත භේදයට තුඩුදෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

### (අ) රජයේ නිවාස හා අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍ර ලබා දීම

අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍ර පහසුකම් ලබාගෙන වාද්දුව, ගාල්ල, හික්කඩුව, වැලිගම, වේයන්ගොඩ, පොතුහැර වැනි ප්‍රදේශවල සිට කොළඹ ප්‍රධාන කාර්යාලයේ සේවයට වාර්තා කරන නිලධාරීන් අට දෙනෙකු සඳහා රත්මලාන නිවාස සංකීර්ණයෙන් නිල නිවාස අටක්ද ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

### (ආ) මිණුම් උපකරණ ඌණතාවය

ජලශක්ති අංශයේ සේවය කර 2002 මැයි 09 දින අනිවාර්ය විශ්‍රාම ගන්වන ලද, ගබඩා භාරකරුවකුගේ 2002 වර්ෂයට පෙර සේවා කාලයේදී සිදුව තිබුණු මිණුම් උපකරණ ඌණතාවයේ වටිනාකම රු. 8,010,875 ක් ලෙස වාර්තා කර තිබූ අතර ඒ සම්බන්ධව පවරන ලද නඩුවේ තීන්දුව අනුව රු. 411,051 ක මුදලක් ඔහුගෙන් අයකරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා මුදල් රෙගුලාසි 104(1)(අ) ඡේදය ප්‍රකාර ගණන්දීමේ නිලධාරී විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබූ අතර මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළයුතු පූර්ණ වාර්තාවද ඉදිරිපත කිරීමට අපොහොසත් වී තිබුණි. 2013 මාර්තු 07 දින ඉදිරිපත් කර තිබූ පරීක්ෂණ වාර්තාවක් අනුව මෙම අලාභය රු. 4,313,239 ක් දක්වා අඩුකර තිබුණි. වසර 10 කටත් පෙර සිදුව ඇති මෙම අලාභය නිවැරදිව ගණනය නොකිරීම හා එම ඌණතාවය අයකර ගැනීම පිළිබඳ නිසි පසු විපරමක් නොකිරීම මතභේදයට තුඩුදුන් කරුණක් බව නිරීක්ෂණය විය.

## 2.10 පාඩු හා හානි

**නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.**

(අ) වාර්තාගත පාඩු හා හානි 541 කින් වටිනාකම තක්සේරු කරන ලද පාඩු හා හානි සංඛ්‍යාව 445 ක් වු අතර ඒවායේ වටිනාකම රු. 69,679,695 ක් විය. මෙයින් රු.52,975,313 කට අදාල පාඩු හා හානි වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවී තිබූ නමුත් ඒවා සම්බන්ධව මුදල් රෙගුලාසි 104 විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දින වන විටත් වාහන අනතුරු සහ ගබඩා ද්‍රව්‍ය ඌණතාවයන් 96 කට අදාල අලාභය තක්සේරු කර නොතිබුණි. මෙයින් අනතුරු 84 ක් වසර පහකට වඩා පැරණි ඒවා වන අතර වසර 20 කට වඩා කල් ගත වී තිබුණු වාහන අනතුරු හා ද්‍රව්‍ය ඌණතාවයන් සංඛ්‍යාව 70 ක් වී තිබුණි.

## 2.11 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවට අදාල විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ජේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මතු වූ කරුණු සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් කරනු ලැබු නිර්දේශ, බලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීමේදී මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කෙරිණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව<br>වර්ෂය | <br>ජේද අංකය | යොමුගත විෂයය | රජය් ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දිනය | සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| - | - | සුගලාදේවි වැව ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු සහකාරවරයෙකු සිදුකර ඇති අක්‍රමිකතා | 2011.07.07 | නිලධාරියාට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම |
| - | - | වේලිඔය ව්‍යාපෘතිය යටතේ සිදුව ඇති අක්‍රමිකතා | 2011.07.07 | නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීම |

| | | | | |
|---|---|---|---|---|
| 2006 | 2.4.1 | ව්‍යාජ ලිපිලේඛන ඉදිරිපත් කර දේපළ ණය ලබා ගැනීම | 2011.07.07 | නිලධාරීන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම |
| 2006 | 7.2 (අ) | වෙහෙරගල ව්‍යාපෘතිය සඳහා කොන්ක්‍රිට් මිශ්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම | 2011.07.07 | තාක්ෂණික ඇගයීම් කමිටුවට එරෙහිව පරීක්ෂණයක් සිදුකිරීම, සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. |
| 2008 | 7(ඇ) (i) | වාහනයක් අනතුරට පත්වී රු.210,000 ක අලාභයක් සිදුවීම | 2011.07.07 | අලාභය රියදුරුගෙන් අයකර ගැනීම |

**(ආ)** ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අයත් නාමලේඛන 30 ක සඳහන් කාර්යයන් සඳහා ඇස්තමේන්තුගත රු.1,248,729 කින් රු.613,817 ක මුදලක් වියදම් නොකර ඉතිරි වී තිබූ අතර මෙයට හේතුව යෝජිත කාර්යය නිසිපරිදි සම්පූර්ණ නොකිරීමද ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාවයක්ද යන්න විගණනයට පැහැදිලි නොවීය.

**(ඇ)** 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනත සහ වරින්වර එයට සිදුකර ඇති සංශෝධන වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**(ඈ)** දීගිලිඔය ජලාශය, ඇල්ලේ වැව ජලාශය හා කුඹුක්කන් ඔය ජලාශය ඉදිකිරීම සඳහා වැය විෂයයන් 3 ක් යටතේ රු. මිලියන 570 ක් වෙන්කර තිබුණද මූලික අවශ්‍යතා සම්පූර්ණ නොවීම නිසා එම ව්‍යාපෘති වෙනුවෙන් කිසිදු වියදමක් නොදරා එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 120 ක් වෙනත් ව්‍යාපෘතිවලට මාරු කර තිබුණි.

**(ඉ)** වැය විෂයයන් 8 ක් යටතේ වූ රු. මිලියන 3,418.6 ක ප්‍රතිපාදනයට වෙනත් වැය විෂයයන්වලින් රු.මිලියන 1,629.5 ක් මාරුකරගෙන තිබූ අතර එම මාරුපත්‍රවල සඳහන් ප්‍රතිපාදනවලින් රු.මිලියන 946.2 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි

**(ඊ)** වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රතිපාදනවලින් වෙනත් රාජ්‍ය ආයතන 9 ක් වෙත මුදාහල රු.424,806,089 ක ප්‍රතිපාදනයෙන් රු. 283,073,921 ක වියදමක් කර තිබූ අතර රු.141,733,068 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.12 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 410 | 267 | 143 |
| (ii) | තෘතියික මට්ටම | 180 | 38 | 142 |
| (iii) | ද්විතියික මට්ටම | 2,380 | 1,609 | 771 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 2,466 | 1,431 | 1,035 |
| | එකතුව | 5,436* | 3,345 | 2,091 |

✶ විගණනයට තහවුරු කරන ලද සංඛ්‍යාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම තථ්‍ය සේවක සංඛ්‍යාවට අමතරව කොන්ත්‍රාත් පදනමින් විවිධ කාර්යයන්හි 211 දෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර අනියම් හා තදුවිත පදනමින්ද සේවකයන් සේවයේ යොදවා තිබුණි. මේ පිළිබඳව නිවැරදි සංඛ්‍යාත්මක තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති පුරප්පාඩු 2,091 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(iii) ස්ථිර අනුමත සේවක සංඛ්‍යාව 5,436 ක් ලෙස විගණනයට තහවුරු කර තිබුණද එය 4,468 ක් ලෙස 2012 රජයේ වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුණි. 968 ක් වූ වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ජේදය |
|---|---|---|---|
| වාරිමාර්ග ඉංජිනේරු | 05 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | සඳහන් නොවේ |
| ඉංජිනේරු සහකාර | 01 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2011 අප්‍රේල් සිට |
| සැලැසුම් ශිල්පි | 01 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2008 ජනවාරි සිට |
| සැලැසුම් ශිල්පි | 01 | ජනාධිපති විමර්ශන ඒකකය | 2005 මාර්තු සිට |
| සැලැසුම් ශිල්පි | 01 | ජනාධිපති විමර්ශන ඒකකය | 2002 සැප්තැම්බර් සිට |
| විහිදුම් සහකාර | 01 | ජනාධිපති විමර්ශන ඒකකය | 2001 මැයි සිට |
| විහිදුම් සහකාර | 01 | ජනාධිපති විමර්ශන ඒකකය | 2005 මාර්තු සිට |
| ඉංජිනේරු සහකාර | 03 | මහවැලි අධිකාරිය | 2012 මාර්තු සිට වසරකට |